# අනුන්ගේ දන් දීම වළක්වා මංකොල්ලකරුවෙකු නොවන්න

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1 - පිටු අංක 290)

යමෙක් අනුන් දෙන දානය වළක්වයි නම්, ඔහු තුන්දෙනෙකුට අන්තරායකාරී මංකොල්ලකරුවෙක් වෙයි. කවර තුන්දෙනෙකුට ද යත්,

- දායකයාගේ පිනට අනතුරු කරයි.
- ප්‍රතිග්‍රාහකයාගේ (ලබන්නාගේ) ලාභයට අනතුරු කරයි.
- මුලින් ම තමාගේ ගුණ මුලින් උපුටා දමා විනාශයට පත් වෙයි.

මෙසේ අනුන්ගේ දානය වළක්වන්නා තුන් දෙනෙකුට අනතුරු ඇති කරන මංකොල්ලකරුවෙක් වෙයි.